# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 86 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 18/01/2024 පැය 1120

## මාධ්‍ය නිවේදනය

### මාධ්‍ය මඟින් වැරදි ලෙස ප්‍රචාරය වන පුවතක් පිලිබඳ පැහැදිලි කිරීම.

2023 අ.පො.ස. උසස් පෙළ විභාගය 2024.01.04 වන දින සිට දිවයින පුරා පාසල් වල ආරම්භ විය. මෙම විභාගයට සමගාමීව පවත්වන ලද කෘෂි විද්‍යාව ප්‍රශ්න පත්‍රයේ දෙවන කොටස විවිධ සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වීමක් සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කරන ලදි.

ඒ අනුව මෙම සිද්ධියට සම්බන්ධ උපකාරක පන්ති පවත්වනු ලබන පාසල් ගුරුවරයෙකු සහ කාර්යාල කාර්ය සහයකවරයෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අත්අඩංගුවට ගන්නා ලදි. මේ සම්බන්ධයෙන් විවිධ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වීමේ දී මෙම කාර්යාල කාර්ය සහයකවරයා මොරටුව මහා විද්‍යාලයට අනුයුක්තව සේවය කරන කාර්ය මණ්ඩල සේවකයෙකු වශයෙන් හඳුන්වා දෙන බව නිරීක්ෂණය වේ.

මොහු මොරටුව මහා විද්‍යාලයේ ස්ථිර සේවකයෙකු ලෙස සේවය නොකරන අතර එම විද්‍යාලයේ ස්ථාපිත කර ඇති විභාග මධ්‍යස්ථානයේ කාර්යාල කාර්ය සහයකවරයෙකු වශයෙන් විභාගයට අදාල රාජකාරි කටයුතු කිරීම සඳහා පමණක් යොදවන ලද සේවකයෙකු වේ. නමුත් ඔහු මොරටුව ප්‍රදේශයේම වෙනත් පාසලක කාර්යාල සහයකවරයෙකු වශයෙන් ස්ථිරව සේවය කරනු ලබන පුද්ගලයෙකි.

ඒ අනුව විවිධ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වන මෙම පුවත සම්බන්ධයෙන් නිවැරදි කිරීම සඳහා ඉහත කරුණු පැහැදිලි කර ඔබ වෙත යොමු කරමි.